IPRC/24/134 Social Sciences and Humanities

# සිංහල කෙටිකතාවල ගතිශීලී ආඛ්‍යාන ශිල්ප විධිය පිළිබඳ විමර්ශනාත්මක අධ්‍යයනයක් (අජිත් තිලකසේනගේ තෝරාගත් කෙටිකතා කිහිපයක් ඇසුරෙනි)

**ජේ.ඒ.ඩී.එස්. කවීශ්වර[1]***

[1]සිංහල අධ්‍යයනාංශය, මානවශාස්ත්‍ර පීඨය, කැලණිය විශ්වවිද්‍යාලය, ශ්‍රී ලංකාව

කෙටිකතාවල අනුභූති ප්‍රකාශනයේදී ආඛ්‍යානයට හෝ වස්තුවට උචිත ලෙස ව්‍යුහය සකස් කෙරෙන අයුරු නිරීක්ෂණය කළ හැකිය. එය නිර්මාණකරුවාගේ අරමුණ සාක්ෂාත් කර ගැනීම සඳහා අන්තර්ගතය ඉදිරිපත් කිරීමේ මාදිලිය වෙයි. වර්තමාන සිංහල කෙටිකතාවෙහි නූතනවාදී මුද්‍රාව තැබූ ලේඛකයෙකු වශයෙන් අජිත් තිලකසේන හැඳින්විය හැකිවේ. **සතුරෝ** (1960) කෙටිකතා සංග්‍රහයෙන් ස්වකීය අනන්‍යතාව ගොඩනැඟීමට යොමු වූ ඔහු; ලේඛන හා කථන භාෂාව, අක්ෂර වින්‍යාසය ආදිය තම අරමුණ කෙරෙහිම කක්ෂගත කළේය. ප්‍රථම කෙටිකතා සංග්‍රහයෙන් චෙකෝවියානු යථාර්ථවාදී රීතිය අනුගමනය කිරීමත් යථාර්ථවාදයට අනුකූල ආඛ්‍යාන ශිල්ප විධි භාවිතයට ගැනීමත් පෙනෙන්නට වෙයි. ඔහුගේ දෙවැනි කෙටිකතා සංග්‍රහය වන **පිටුවහල් කර සිටිද්දී** (1964) කෘතියෙන් ආඛ්‍යාන රීති හා ශිල්පීය ලක්ෂණවල ස්වාධීන භාවය ඉස්මතු කොට පෙන්වීය. 'කියන දෙයට වඩා කියන ආකාරය' කෙරෙහි තමා වැඩි අවධානයක් දක්වන බව ඔහුගේ ප්‍රකට කියමනකි. මෙය නිර්මාණයක ආඛ්‍යානවේදය පිළිබඳ දක්වන ප්‍රබල අදහසක්ය. ඔහුගේ කෙටිකතාවල ව්‍යුහාත්මක ලක්ෂණ මගින් ශිල්ප විධි රැසක් අනාවරණය කර ගත හැකි වුවද, ඒවා අතරින් වැදගත් ශිල්පීය ලක්ෂණයක් ලෙස කෙටිකතාවක ගතිශීලී භාවය හඳුන්වා දිය හැකිය. ගතිශීලී භාවය යනු; කතා වස්තුවෙහි ගලාගෙන යන සංචලනමය ස්වභාවයයි. ක්ෂණිකව වෙනස් වන නාට්‍යාකාර වර්ධනීය භාවයයි. නාට්‍යයක් රචනා වනුයේ වේදිකා නිෂ්පාදනය අරමුණු කොට බැවින් ඒ සඳහා පරිභාවිත ශිල්ප විධි ප්‍රායෝගිකත්වය මුල් කොට ගොඩ නැඟෙයි. කෙටිකතාව වැනි ලිඛිත නිර්මාණයක, නාට්‍යයක පැවතිය යුතු ශිල්පීය ලක්ෂණයන් භාවිත කිරීමේ යෝග්‍යතාව කෙබඳුද? යන්න විමර්ශනය කිරීම මෙහි පර්යේෂණ ගැටලුවයි. ඒ සඳහා **පිටුවහල් කර සිටිද්දී** සංග්‍රහයෙන් 'හොඳ ඇයෝ', **සුන්නද්දූලිහි** (1970) 'වැද්දන් සමඟ යුද වදින්නට', **සාදයහි** (1992) 'තුන් වෙනියා', **වන්දනාව** (1996) කෘතියෙහි 'වතුර' සහ **සුසුම සහ පීඩාව** (2000) සංග්‍රයේ 'අතරමග' යන කෙටිකතා කෙරෙහි මුඛ්‍යාවධානය යොමුවෙයි. මෙකී කතාවල ගතිශීලී බව ඇති කිරීම සඳහා සිද්ධි නිරූපණයත් සංවාදවල පවතින ප්‍රබෝධමත් ස්වභාවයත් ස්වකීය අනන්‍යතාව පෝෂණය කරන අයුරු අධ්‍යයනය කිරීම පර්යේෂණයේ අරමුණයි.

**මුඛ්‍ය පද:** ආඛ්‍යානවේදය, ගතිශීලී භාවය, ප්‍රබෝධාත්මක සංවාද, ශිල්ප විධි

*sudeshk@kln.ac.lk
ORCiD ID: https://orcid.org/0009-0001-5927-4562